# කොරියාවට විදේශ ශ්‍රමිකයන් බඳවා ගැනීම සඳහා වන ලකුණු ලබාදීම මත පවත්වන විභාගය පිළිබඳ නිවේදනයයි

කොරියාවේ රැකී රක්ෂා සහ කම්කරු අමාත්‍යාංශයත්( MOEL ) **ශ්‍රී ලංකාවේ විදේශ රැකියා** අමාත්‍යාංශයත් (MFE ) අතර ඇති අවබෝධතා ගිවිසුම අනුව ඇගයුම් මත ලකුණු මගින් ශ්‍රමිකයින් බඳවා ගැනීම සඳහා වන ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.

මෙම ඇගයුම් මත ලකුණු ලබාදීමේ ක්‍රමය මගින් අපේක්ෂකයින් සතු කොරියානු භාෂා හැකියාව පමණක් නොව කුසලතාවය,කායික තත්ත්වය සහ වැඩ අත්දැකීම් පිළිබඳ ගැඹුරින් සොයා බලනු ලැබේ. අපේක්ෂකයින්ගේ කායික තත්ත්වයන් පරීක්ෂා කිරීමේදී වර්ණ අන්ධභාවය සහ වර්ණ දුර්වලතා සහිත අයට ඇගයුම් ලකුණු ක්‍රමයට ඉදිරිපත් වීමට අවසර දෙනු නොලැබේ.තවද කොඳු ඇට පෙළේ ආබාධ සහ ඇඟිලි අඩු, කැපුණු අයට මෙම ක්‍රමය අනුව අවසර දෙනු නොලැබේ.

අදාළ කර්මාන්ත සඳහා **රැකියා** අපේක්ෂිතයින් තෝරාගනු ලබන්නේ ඔවුන් ලබාගන්නා ඉහළ ලකුණු මට්ටම අනුව වේ.පළමු වටය සමත්වීම සඳහා අපේක්ෂකයින් විසින් අවම ලකුණු මට්ටමට වඩා ඉහළින් සිටිය යුතුයි.නිෂ්පාදන සඳහා අවම ලකුණු 44 ඉදිකිරීම් සඳහා අවම ලකුණු 36 වේ.

පළමු වටයේ සමත් වන්නන් සඳහා දෙවන වටයේදී කුසලතා පරීක්ෂණයට හා නිපුණතා පරීක්ෂණයට අවස්ථා ලැබේ.දෙවන වටයේදී එම පරීක්ෂණ වලට ගන්නා ලකුණු එකතු වේ.ඒ අනුව සියලුම පරීක්ෂණ වලට ලැබෙන ලකුණු එකතු කර ඉහලම ලකුණු ගන්නා අය මෙම ලකුණු මත ඇගයුම් ක්‍රමවේදය මගින් තෝරාගනු ලැබේ.

මෙම පරීක්ෂණ ක්‍රියාවලියේදී දෙවන වටය තුළ අපේක්ෂකයින්ට තමා තෝරාගත් කර්මාන්තයට අනුව කාර්ය පළපුරුද්ද තිබේද , එම ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් සඳහා සහතික තිබේද යන්න පිළිබඳ ලිඛිත සහතික මෙම නිපුණතා ඇගයීම් සඳහා ඉදිරිපත් කළ යුතුය.

අපේක්ෂකයින් මෙම ඇගයුම් ක්‍රමවේදයට ඉල්ලුම් කිරීමට පෙර තමාගේ වර්ණ අන්ධභාවය සහ වර්ණ පෙනීම පිළිබඳ තත්ත්වයන් පරීක්ෂා කරගැනීමෙන් පසුව EPS පරීක්ෂණයේ ප්‍රථම වටයට ඉල්ලුම් කළ යුතුයි.

ඒ අනුව වර්ණ අන්ධභාවය සහ වර්ණ දුර්වලකම් ඇති අය මෙම විභාගයෙන් සමත් නොකරනු ඇත.යම් අපේක්ෂකයෙකුගේ කායික තත්ත්වය ප්‍රායෝගික වැඩබිමකට තරම් සුදුසු නොවන බව තීන්දු වන විට එම පිරිසත් මෙම තෝරාගැනීම් වලින් ඉවත් කරනු ලැබේ.

කොරියාවේ මානව සම්පත් අංශය කොරියානු කර්මාන්ත සඳහා ශ්‍රමිකයින් බඳවා ගැනීමේදී එය වඩාත් පහසු කිරීම සඳහා මෙම ඇගයුම් ලකුණු ක්‍රමය හඳුන්වා දීමට තීරණය කරන ලදි.ඒ අනුව මෙම ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබගේ සහයෝගය අපේක්ෂා කරමි.

2017 පෙබරවාරි මස 23 වැනිදා

අධීක්ෂණය : රැකීරක්ෂා හා කම්කරු අමාත්‍යාංශය - කොරියාව

පරිපාලනය : කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතන

සහයෝගීතාවය : **විදේශ රැකියා** අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**

**ඇගයුම් පාදක ලකුණු ක්‍රමය මත බඳවාගැනීම යනු කුමක්ද?**

1. පරමාර්ථ

වර්තමාන EPS - TOPIK ක්‍රමවේදය තුළ තිබෙන රැකියා අපේක්ෂිත ලැයිස්තුව මගින් කොරියානු සේවායෝජකයින්ට අවශ්‍ය අනෙකුත් සුදුසුකම් වන කාර්ය පැවරුම් සම්පූර්ණ කිරීමේ කාර්යක්ෂමතාවය, පුද්ගල කායික සුදුසුකම් සහ කර්මාන්තයට අදාල අත්දැකීම් නිරික්ෂණය කිරිමට හැකියාවක් නැත.

කොරියානු භාෂාව කථාකිරීම අඩු මට්ටමක තිබෙන එහෙත් කාර්යසාධනයේදි නිපුණතා මට්ටම ඉහල අයට වර්ථමාන EPS ක්‍රමය තුළ ලැබෙන අවස්ථා සීමිත වී ඇත.

මෙම සීමාවන් මගහරවා ගැනීම සඳහා කොරියාවේ මානව සම්පත් සංවර්ධන අංශය මගින් මෙම නව ක්‍රමවේදය නිර්මාණය කරන ලදි. එ මගින් ශ්‍රමිකයාගේ තත්ත්වයන් පිළිබඳව සංකීර්ණ ලෙස ඇගයීමට භාජනය කරනු ලැබේ. භාෂා හැකියාව පමණක් නොව කාර්ය අත්දැකීම් සහ කුසලතා සඳහා එහිදී ලකුණු ලැබේ.

මෙම ක්‍රමය මගින් නිවැරදි ශ්‍රමිකයෙකු තෝරා ගැනීම සඳහා සේවායෝජකයින්ට අවස්ථාව ලැබේ.ඒ අනුව ශ්‍රමිකයාගේ TOPIK විභාග ලකුණු ජාතික වෘත්තිය සුදුසුකම් සඳහා සහතික හා රැකියාවල පළපුරුද්ද පිළිබඳව තොරතුරු සේවායෝජකයාට ලබාගත හැක.

මෙම ක්‍රමවේදය මගින් කොරියානු භාෂාවට ලකුණු අඩුවෙන් ගන්නා , එහෙත් රැකියා තුළ අති දක්ෂ සාධන මට්ටම් සහිත අයවලුන් සඳහා වැඩි අවස්ථා ලැබේ.




2. විදේශ ශ්‍රමිකයන් සඳහා වන ඇගයුම් පාදක ලකුණු ක්‍රමයේ අන්තර්ගතය

- බඳවා ගැන්නා ක්‍රමවේදය : 1 පළමු වටයේ පරික්ෂණ (EPS-TOPIK) 2 දෙවන වටයේ පරික්ෂණ ( කුසලතා පරික්ෂණය + නිපුණතා පරික්ෂණය) 3. ලකුණු එකතු කිරිම

- අවසාන සාමාර්ථලාභීන් තීරණය කිරිම : සාමාර්ථලාභීන්ගේ උපරිම ලකුණු ලබාගැනීම අනුව (වැඩිම ලකුණු ප්‍රථමයෙන්)

**කර්මාන්ත අනුව ලකුණු ව්‍යාප්තිය**

**කර්මාන්ත අනුව ලකුණු ව්‍යාප්තිය**

| කර්මාන්තය | මුළු ලකුණු | EPS ලකුණු | කුසලතා පරික්ෂණය | නිපුණතා ලකුණු (අමතර ලකුණු) | | |
|---|---|---|---|---|---|---|
| | | | | රැකියා පළපුරුද්ද (වසරකට වැඩි) | වෘත්තීය පුහුණු සහතික (පැය 120 වැඩි) | රජයෙන් නිකුත් කරන සහතික |
| නිෂ්පාදන | ලකුණු 200 | 100 | 100 | 3 | 1 | 1 |
| ඉදිකිරීම් | ලකුණු 200 | 90 | 110 | 3 | 1 | 3 |

**3 පරික්ෂණයේ පළමු වටය(EPS – TOPIK)**

- පරික්ෂණයේ කාල පරිච්ඡේදය (ප්‍රශ්න) : මිනිත්තු 50 (කියවීම (ප්‍රශ්න 20) මිනිත්තු 25, සවන්දීම (ප්‍රශ්න 20) මිනිත්තු 25)
- පරික්ෂණයේ ස්වභාවය :
  බහුවර්ණ ප්‍රශ්ණ , සවන්දීම සඳහා වන විභාගය කියවීම පිළිබඳ විභාගයෙන් පසුව පවත්වයි

- **කර්මාන්ත අනුව ලකුණු ව්‍යාප්තිය**

| නිෂ්පාදන | ඉදිකිරීම් |
|---|---|
| ලකුණු 100 (ප්‍රශ්නයකට ලකුණු 2.5) | ලකුණු 90 (ප්‍රශ්නයකට ලකුණු 2.25) |

- EPS – TOPIK සමත්වන්නන්:
  සමස්ථ පරික්ෂණයට ලකුණු 150% න් වැඩිපුර ලකුණු ප්‍රමාණයක් ගනු ලබන්නේ අපේක්ෂකයින් අවශ්‍ය සංඛ්‍යාවට අනුව සමතුන් බවට පත්වේ.(අවම වශයෙන් ලකුණු 44 ක් නිෂ්පාදන අංශයට ද ලකුණු 36 ක් ඉදිකිරීම් අංශයට ද ගැනීම අනිවාර්යය වේ.

**02.** වන වටය( **කුසලතා පරික්ෂණය)**

- කුසලතා පරික්ෂණය අවශ්‍ය වන කර්මාන්තය:-නිෂ්පාදන සහ ඉදිකිරීම්

කොටස් තුනකින් යුක්ත වේ.

01.කායික ශක්තිය
02.සම්මුඛ පරික්ෂණය
03.මූලික කුසලතා

- **ඇගයීම් ලකුණු ව්‍යාප්තිය**

| **කර්මාන්ත** | **මුළු ලකුණු** | **කුසලතාපරික්ෂණය** | | |
|---|---|---|---|---|
| | | **කායික පරික්ෂණය** | **සම්මුඛ පරික්ෂණය** | **මූලික කුසලතා** |
| නිෂ්පාදන | 100 | 30 | 30 | 40 |

| | | | | |
|---|---|---|---|---|
| ඉදිකිරීම් | 100 | 30 | 30 | 50 |

**02. නිපුණතා පරික්ෂණය**

- ඉලක්ක කණ්ඩායම:-EPS – TOPIK සමත් වූ අය

මෙම පරික්ෂණයට සුදුසුකම් ලබන්නේ, තෝරාගත් කර්මාන්තයේ අත්දැකීම් ඇති,ජාතික තලයේ සහතිකපත් හිමි සහ කර්මාන්තයට අදාල පුහුණු පාඨමාලා සම්පූර්ණ කර ඇති පළමු වටයේ සමත් වූ අයවලුන්වය.

- මෙම පරික්ෂණය සඳහා සුදුසුකම් තිබෙන අයට එම පරික්ෂණයට පෙනීසිටීම අවශ්‍ය වන අපේක්ෂකයින් විසින් පිරවිය යුතු ලේඛණ සටහන් **ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවියෙන්** හෝ ලියාපදිංචිය ලබන ස්ථානයෙන් ලබාගත හැකියි.මෙම ලේඛණ අදාල අපේක්ෂකයා විසින් පුරවාගෙන ඒවා සනාථ කිරිමට අවශ්‍ය සහතික සමඟ පැමිණිය යුතුයි.

- යම් අපේක්ෂකයෙක් ඉල්ලුම් කළ කර්මාන්තයට අදාලව පුහුණුව නොලබා තිබේ නම්,සහතික නොමැති නම් හා සේවා පළපුරුද්ද නොමති නම් ,මෙම නිපුණතා පරික්ෂණයට පෝරම පිරවිය යුතු නැති අතර එවැනි අය එම පරික්ෂණය සඳහා පෙනී සිටිය යුතු නැත.

0 **නියමිත දිනය:-** දෙවන වටයේ පරික්ෂණය පැවැත්වෙන අවසාන දිනය දක්වා මෙම පරික්ෂණය ලේඛණ ඉදිරිපත් කල හැකිය.

**03.නිපුණතා පරික්ෂණය සඳහා භාරදුන් ලේඛණ/ සහතික පරික්ෂා කර බැලීමේ ක්‍රමවේදය**

- යම් අපේක්ෂකයෙක් විසින් ව්‍යාජ සහතික ඉදිරිපත් කර තිබුණහොත් එම අයගේ ප්‍රතිඵල අවලංගු කරන අතර,ලැයිස්තුවෙන් නම ඉවත් කරනු ලැබේ.තවද එවැනි අයට වසර දෙකක් යන තුරු නැවත EPS ක්‍රමයට අයදුම් කිරිමද තහනම් කරනු ඇත.

| ප්‍රථම අදියර | දෙවන අදියර | තුන්වන අදියර |
|---|---|---|
| ලබාදී ඇති ලේඛණ සහ සහතික **ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින්** පරීක්ෂා කරන අතර , ඒවා නිවැරුදිද යන්න තවදුරටත් තහවුරු කිරීමට කටයුතු කරනු ලැබේ. | කර්මාන්තයට අදාල වන ප්‍රශ්න සම්මුඛ පරික්ෂණයේ දී අසනු ලැබේ.( කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනයේ නිලධාරීන් විසින්) | කුසලතා පරික්ෂයෙන් පසුව තවදුරටත් භාරදුන් ලේඛණ වල යම් ගැටළු ස්වභාවයක් තිබේ ද යන්න පරික්ෂා කරනු ලබයි.( කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනයේ නිලධාරීන් විසින්) |

**01 .පරික්ෂණයේ පළමු වටය**

ප්‍රථම වටයේ පරික්ෂණය පවත්වනු ලබන ක්‍රියා පිළිවෙල(EPS-TOPIK )

- **පළමු වටයේ පරික්ෂණය නිවේදනය කිරීම:-**2018 පෙබරවාරි මස 23 වන දින
- **පළමු වටය සඳහා අයදුම්පත් කැඳවීම**:-2018 පෙබරවාරි මස 26 දින සිට 2018 මාර්තු 02 වන දින දක්වා( **2018** මාර්තු මස **01** වන පෝය දිනය හැර)
- **පරික්ෂණය පවත්වන ස්ථානය පිළිබඳව දැනුම් දීම:-** (ඉදිකිරීම් සඳහා)-2018 මාර්තු 12

- **EPS -TOPIK විභාගය පැවැත්වීම:-** (**ඉදිකිරීම් සඳහා**)-2018 මාර්තු 19 සිට මැයි 04 (**නිෂ්පාදන සඳහා** -2018 මැයි 25 සිට ඔක්තෝම්බර් 05)
- **ප්‍රතිඵල නිවේදනය කිරීම:-** ඉදිකිරීම් 2018 මැයි 11/නිෂ්පාදන 2018 ඔක්තෝම්බර් 19

**1. ප්‍රථම වටයේ විභාගයෙන් අපේක්ෂිත සමත්වන්නන්ගේ සංඛ්‍යාව**

| කර්මාන්ත | **EPS – TOPIK** ලකුණු ව්‍යාප්තිය | ප්‍රථම වටයේ දී සමත්වන්නන්ගේ අපේක්ෂිත සංඛ්‍යාව | දෙවන වටයේ දී සමත්වන්නන්ගේ අපේක්ෂිත සංඛ්‍යාව | ප්‍රමතිය |
|---|---|---|---|---|
| **සම්පූර්ණ ගණන** | | පසුව නිවේදනය කරනු ලැබේ | පසුව නිවේදනය කරනු ලැබේ | ප්‍රථම වටයේ සමත්වීම සඳහා අපේක්ෂිකයින් විසින් සම්මත අවම ලකුණු වලට ඉහලින් ලකුණු ලබාගත යුතු වේ.<br>නිෂ්පාදන -44<br>ඉදිකිරීම් -36<br><br>ඉන්පසු වලංගු සේවා මුර අනුව උපරිම ප්‍රමාණයක් වන 150% ක අයැදුම්කරුවන් ඉහළ ලකුණු ලබාගැනීම මත කර්මාන්ත අංශයට බඳවා ගැනේ. |
| **නිෂ්පාදන** | 100 | ,, | | |
| **ඉදිකිරීම්** | 90 | ,, | | |

**1. කර්මාන්ත සහ උප කොටස්**

- අපේක්ෂකයා විසින් එක් කර්මාන්තයක් පමණක් තෝරා ගත යුතුය.(නිෂ්පාදන හෝ ඉදිකිරීම් ) එසේම එක් උපකොටසක් පමණක්ද තෝරා ගත යුතුය.තෝරාගැනීමෙන් පසුව කිසිදු වෙනසක් කළ නොහැක.

- නිෂ්පාදන අංශයේ උප කොටස් - 1.ඇසුරුම් කිරීම2. මැනීම් කටයුතු 3. සම්බන්ධකිරීම්

- ඉදිකිරීම් අංශයේ උප කොටස් -1. වඩු වැඩ 2. වානේ සහ කොන්ක්‍රීට් ආශ්‍රීත ඉදිකිරීම් වැඩ

- **එක් අපේක්ෂකයෙක් සුදුසුකම් ලබන්නේ එක් අයදුම්පතකට පමණී.අයදුම්පත් කිහිපයක් ඉදිරිපත් කිරීම තහනම් වේ.**

**3 . සුදුසුකම්**

a) වයස- අවුරුදු 18 ත් 39 ත්අතර ( 1978 පෙබරවාරි 27 සිට 2000 පෙබරවාරි 26 දක්වා)
b) සිරදඬුවම් හෝ බරපතල දඬුවම් නොලැබුණු අය විය යුතුය.
c) කොරියානු ජනරජයෙන් ආපසු හරවා හෝ නෙරපා එවූ අය නොවිය යුතුය.
d) මෙරටින් බැහැරවීම තහනම් නොකළ යුතුය.
e) වර්ණ අන්ධ හෝ වර්ණ දුර්වලකම් නොමැති අය

f) **E-9 වීසා කාණ්ඩය සහ E-10 වීසා කාණ්ඩය යන වීසා කාණ්ඩ දෙක යටතේම වූ සේවා කාලයද ඇතුළුව වසර 05කට වඩා සේවා කාලයක් දකුණු කොරියාවේ සේවය කර නොමැති තැනැත්තන්**

g) කොදු ඇට පෙළේ ආබාධයක් හෝ ඇඟිලි ආබාද ඇති අයට EPS-TOPIK විභාගයට පෙනී සිටිමට අවස්ථාව නොමැත.

**4.EPS-TOPIK විභාගය සඳහා අයදුම් කිරීම.**

- අයදුම්පත් භාරගන්නා කාලය : 2018 පෙබරවාරි මස 26 දින සිට 2018 මාර්තු 02 වන දින දක්වා( **2018 මාර්තු මස 01 වන පෝය දිනය හැර)- (පෙ.ව.9.00 සිට ප.ව.4.30 දක්වා)**

a) පහත සඳහන් මධ්‍යස්ථානවලින් අයදුම්පත් ලබාගත හැකිය.

| දිස්ත්‍රික්කය | අයදුම්පත් නිකුත් කරනු ලබන මධ්‍යස්ථාන | ලිපිනය |
|---|---|---|
| 01.අනුරාධපුර | අනුරාධපුර,ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පළාත් කාර්යාලය | විදේශ සේවා නියුක්ති කාර්යාංශ,පළාත් කාර්යාලය, අංක 395/12 ඒ,මුදිත මාවත,කඩපනහ,අනුරාධපුරය |
| 02.කුරුණෑගල | කුරුණෑගල , ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ | විදේශ සේවා නියුක්ති කාර්යාංශ,පළාත් කාර්යාලය අංක 235/32,විජයබා මාවත,මීගමු පාර,කුරුණෑගල |
| 03.මහනුවර | මහනුවර,ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පළාත් කාර්යාලය | විදේශ සේවා නියුක්ති කාර්යාංශ,පළාත් කාර්යාලය,අංක353,කෙහෙල්වල,කිරිබත්කුඹුර |
| 04.බදුල්ල | සම්පත් මධ්‍යස්ථානය,බදුල්ල | හාලිඇල,කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය අසල පිහිටි සම්පත් මධ්‍යස්ථානය,බදුල්ල පාර,හාලිඇල |
| 05.රත්නපුර | රත්නපුර, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පළාත් කාර්යාලය | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පළාත් කාර්යාලය,අංක 289/6,විද්‍යාල මාවත,හිදැල්ලන,රත්නපුර |
| 06.වවුනියාව | වවුනියාව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පුහුණු මධ්‍යස්ථානය | විදේශ සේවා නියුක්ති කාර්යාංශ,පුහුණු මධ්‍යස්ථානය, අංක 56/ඒ,දුම්රිය පොළ පාර, වෛරවපුලියම්කුලම, වවුනියාව |
| 07.කළුතර | මතුගම, විදේශ සේවා නියුක්ති කාර්යාංශය,විගමණික සම්පත් මධ්‍යස්ථානය, | විදේශ සේවා නියුක්ති කාර්යාංශය,විගමණික සම්පත් මධ්‍යස්ථානය,බණ්ඩාරනායක මාවත,මතුගම වත්ත,මතුගම |
| 08.ගාල්ල | ගාල්ල, විදේශ සේවා නියුක්ති කාර්යාංශ,පුහුණු මධ්‍යස්ථානය | විදේශ සේවා නියුක්ති කාර්යාංශ,පුහුණු මධ්‍යස්ථානය, අංක 289,කොළඹ පාර, මහමෝදර,ගාල්ල |
| 09.පොළොන්නරුව | පොළොන්නරුව, විදේශ සේවා නියුක්ති කාර්යාංශ,පුහුණු මධ්‍යස්ථානය | විදේශ සේවා නියුක්ති කාර්යාංශ, පුහුණු මධ්‍යස්ථානය, අංක 63, නව නගරය, පොළොන්නරුව |
| 10.ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය, විදේශ සේවා නියුක්ති කාර්යාංශ,පුහුණු මධ්‍යස්ථානය | විදේශ සේවා නියුක්ති කාර්යාංශ,පුහුණු මධ්‍යස්ථානය, අංක 344, 4 වන සැතපුම් කණුව, නුවර පාර,ත්‍රිකුණාමලය |
| 11.හම්බන්තොට | තංගල්ල, විදේශ සේවා නියුක්ති කාර්යාංශය,විගමණික සම්පත් මධ්‍යස්ථානය | විදේශ සේවා නියුක්ති කාර්යාංශය,විගමණික සම්පත් මධ්‍යස්ථානය, යායවත්ත, ගොඩිගමුව |
| 12.ගම්පහ | විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහන පියස මධ්‍යස්ථානය | විදේශ සේවා නියුක්ති කාර්යාංශය, අංක 101/5/3,මීගමු පාර,කටුනායක |
| 13.කොළඹ | පන්නිපිටිය, විදේශ සේවා නියුක්ති කාර්යාංශ,පුහුණු මධ්‍යස්ථානය | පන්නිපිටිය,ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පුහුණු මධ්‍යස්ථානය, අංක 241/1, පරණ පාර,පන්නිපිටිය |
| 14.මාතලේ | දඹුල්ල, විදේශ සේවා නියුක්ති කාර්යාංශය පුහුණු මධ්‍යස්ථානය, | දඹුල්ල,විදේශ සේවා නියුක්ති කාර්යාංශය පුහුණු මධ්‍යස්ථානය, අංක 03, නිශ්ශංක මාවත, දඹුල්ල |
| 15.අම්පාර | අම්පාර, විදේශ සේවා නියුක්ති කාර්යාංශය පුහුණු මධ්‍යස්ථානය | අම්පාර,විදේශ සේවා නියුක්ති කාර්යාංශය පුහුණු මධ්‍යස්ථානය,අංක 23/58 ඒ,ගැමුණුපුර,අම්පාර |
| 16.පුත්තලම | හලාවත, විදේශ සේවා නියුක්ති | හලාවත, විදේශ සේවා නියුක්ති කාර්යාංශය පුහුණු |

| | | |
|---|---|---|
| | කාර්යාංශය පුහුණු මධ්‍යස්ථානය | මධ්‍යස්ථානය, මයියක්කුලම,කොළඹ පාර,හලාවත |
| 17.මඩකලපුව | මඩකලපුව,විදේශ සේවා නියුක්ති කාර්යාංශය පුහුණු මධ්‍යස්ථානය | මඩකලපුව,විදේශ සේවා නියුක්ති කාර්යාංශය පුහුණු මධ්‍යස්ථානය, අංක 435/11,කන්නකායි අම්මන් කෝවිල් පාර,මඩකලපුව |
| 18. යාපනය | යාපනය,විදේශ සේවා නියුක්ති කාර්යාංශය පුහුණු මධ්‍යස්ථානය | යාපනය,විදේශ සේවා නියුක්ති කාර්යාංශය පුහුණු මධ්‍යස්ථානය, අංක 56,වැපල් වීදිය,යාපනය |

b) අයදුම්කිරිම: අපේක්ෂකයාම පැමිණ අයදුම් කළ යුතු වේ.

**c) අවශ්‍ය ලේඛණ-**

- **1 . අයදුම්පත්‍රය (ලියාපදිංචියේදී ලබා දෙනු ලැබේ.)**

❖ සෑම අයදුම්පතයකම අංක මුද්‍රණය කර ඇත. එක් අයදුම්කරුවෙකුට එක් අයදුම්පතක් පමණක් භාරදිය හැකිය.අයදුම්පත්‍ර පිරවීමේදී යම් වරදක් සිදුවුයේ නම් එම වරද ටිපෙක්ස් කර නැවත නිවැරදි කළ යුතුවේ.

❖ නිපුණතා පරීක්ෂණය සඳහා පෙනි සිටිමට අවශ්‍ය වන අය ඒ සඳහා වන පෝරමය ලබා ගත යුතුවේ.( විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී එය ලබාගත හැක)

එම ලියාංදිංචියේදීම ලබාගෙන අයදුම්පත්‍රය සමඟ භාර දිය යුතුවේ.

- **2. විදේශ ගමන් බලපත්‍රයේ පිටපත**

❖ තමාගේ වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක් අවශ්‍ය වේ.

❖ තම විදේශ ගමන් බලපත්‍රයේ තිබෙන නමට වෙනස් ආකාරයට තම නම අයදුම්පත්‍රයේ සඳහන් වේනම් ඒ මඟින් කොරියාවට යා නොහැක.

❖ අයදුම්කරුවන්ගේ පෞද්ගලික තොරතුරුවල යම් වෙනසක් සිදුවී තිබේ නම් ඒ සඳහා සම්පූර්ණ වගකීම අයදුම්කරු විසින් භාරගත යුතුවේ.

❖ එම නිසා අයදුම්පත් භාරදීමට පැමිණීමේදී සිය විදේශ ගමන් බලපත්‍රය ලබාගෙන තිබිම සහ එය රැගෙන ඒම අනිවාර්යය වේ.

❖ අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත්‍රයේ සඳහන් කරන පෞද්ගලික තොරතුරු වන නම,උපන් දිනය,ගමන් බලපත්‍ර අංක,ස්ත්‍රී පුරුෂ භාවය සහ ලබාදීමේදී භාවිතා කරනු ලැබේ.එම තොරතුරු කිසිසේත්ම වෙනස් විය නොහැක.

- **3. ඡායා රූපවල ප්‍රමාණය- සෙ.මී.3.5 X4.5 (මාස 03ක් ඇතුළත ලබාගත් එකක් විය යුතුය)**

- යම් අපේක්ෂකයකු ඡායාරූපය මඟින් විභාගයේදී හඳුනාගත නොහැකි නම් විභාගයට පෙනී සිටිමට අවසර දෙනු නොලැබේ

- **සැ.යු - විභාගයට පෙනි සිටිමේදී පුද්ගලයන් ලබාදුන් ඡායාරූපයත්, විදේශ ගමන් බලපත්‍රයේ ඡායාරූපයත් අතර කිසිදු වෙනසක් නොතිබිය යුතුය)**

- 04. **විභාග ගාස්තුව**

❖ ඇමරිකානුඩොලර් **24 ( රු.3772/-)**

| |
|---|
| **අයදුම්කරු විභාගය සඳහා ලියාපදිංචිය ලබාගත් පසු යම් හේතුවක් මත එය අවලංගු කිරීමට අවශ්‍ය වුවහොත් ලියාපදිංචි ගාස්තුව ආපසු ගත නොහැක.** |

**05. පළමු වටයේ විභාග මධ්‍යස්ථාන පිළිදබඳව දැනුම්දීම සහ වේලාව-**

- මධ්‍යස්ථානය - පරිගණක ආශ්‍රිත විභාග මධ්‍යස්ථානය,කොළඹ අංක 205,දෙපානම,පන්නිපිටිය

- නිවේදනය කරන දිනය -2018 මාර්තු 12 (ඉදිකිරිම්)/2018 මැයි 18(නිෂ්පාදන)

- ක්‍රමය - 1. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවිය - www.slbfe.lk

  2. http://epstopik.hrdkorea.or.kr

**6. විභාග දිනය සහ විභාග කාලපරිච්ඡේදය**

**- විභාග දිනය - ඉදිකිරිම් 2018 මාර්තු 19 සිට මැයි 04 දක්වා**

**නිෂ්පාදන 2018 මැයි 25 වන දින සිට ඔක්තෝම්බර් 05 දක්වා**

(අයදුම්කරුවන්ගේ ප්‍රමාණය අනුව විභාග දින වෙනස් වේ.එක් එක් අයදුම්කරුවන්ගේ විභාග දින දැනගැනීම පිණිස ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවියට පිවිසෙන්න. (www.slbfe.lk) 2018 මාර්තු 12 (ඉදිකිරිම්)/2018 මැයි 18(නිෂ්පාදන)

**-විභාග කාල පරිච්ඡේදය**

| **විභාග කොටස** | **අයදුම්කරුවන් සඳහා පූර්ව අවබෝධය ලබාදීම** | **කාල පරිච්ඡේදය** | |
|---|---|---|---|
| | | **කියවීම** | **සවන්දීම** |
| පළමු සැසිය | 09.30-10.00 | 10.00-10.25( මිනිත්තු 25) | 10.25-10.50(මිනිත්තු 25) |
| දෙවන සැසිය | 11.00-11.30 | 11.30-11.55( මිනිත්තු 25) | 11.55-12.20(මිනිත්තු 25) |
| තුන්වන සැසිය | 13.30-14.00 | 14.00-14.25( මිනිත්තු 25) | 14.25-14.50(මිනිත්තු 25) |
| හතරවන සැසිය | 15.00-15.30 | 15.30-15.55(මිනිත්තු 25 | 15.55-16.20(මිනිත්තු 25) |

- ❖ විභාග අපේක්ෂකයින් සිය සැසිය සඳහා පැමිණීමේදී පූර්ව අවබෝධය ලබාදෙන ස්ථානයේ පෙ.ව.9.30, පෙ.ව.11.00,ප.ව.1.30 සහ ප.ව.15.00 වන විට පැමිණ අසුන්ගෙන සිටිය යුතුය.

- ❖ විභාග සැසියේ විස්තර සහ කාල පරිච්ඡේදය පවතින වතාවරණය අනුව වෙනස් විය හැකිය.

**7. පළමු වටයේ පිළිවෙළ-**

| **කොටස** | **ප්‍රශ්න ප්‍රමාණය** | **මුළු ලකුණු** | | **කාලය** |
|---|---|---|---|---|
| | | **නිෂ්පාදන** | **ඉදිකිරිම්** | |
| කියවීම | 20 | 100 | 90 | මිනිත්තු 25 |
| සවන්දීම | 20 | | | මිනිත්තු 25 |
| **එකතුව** | **40** | **100** | **90** | **මිනිත්තු 50** |

a) විභාග රාමුව සහ EPS-TOPIKසඳහා වන නිර්නායක

- **(පරීක්ෂණ රාමුව )** -01. බහුවිධ පිළිතුරු මඟින් 02. කියවීම සහ සවන්දීම විරාමයකින් තොරව පරීක්ෂා කරනු ලැබේ.

- **නිෂ්පාදන සඳහා වන නිර්නායක -** භාෂා විභාගයෙන් ලකුණු 100 ක් සහ 44ට වඩා වැඩියෙන් ලබාගන්නා සහ මුළු ලකුණු 150% ක් වැඩිපුරම ලකුණු ගන්නා අය අතරින් ඉහළම ලකුණුවල සිට පහලට අවශ්‍ය ප්‍රමාණය දක්වා තෝරාගනු ලැබේ.

- **ඉදිකිරීම් සඳහා නිර්නායක**-භාෂා විභාගයෙන් මුළු ලකුණු 90 ක් සහ 36 ට වඩා වැඩිපුර ගන්නා අය සහ සමස්ථ පරීක්ෂණ ලකුණු 150% න් වැඩිපුරම ගන්නා අය අතරින් ඉහළම ලකුණුවල සිට පහළට අවශ්‍ය ප්‍රමාණය තෝරා ගනු ලැබේ.

**b) පරීක්ෂණය සඳහා අවශ්‍ය දෑ**

- විභාග අපේක්ෂකයාගේ විභාග ප්‍රවේශ පත්‍රය
- අපේක්ෂකයාගේ ඡායාරූපය අලවා ඇති ප්‍රවේශ පත්‍රය

1. වලංගු විදේශ ගමන් බලපත්‍රය

   සෑම අයදුම්කරුවෙකුම වලංගු විදේශ ගමන් බලපත්‍රය රැගෙන ආ යුතුය.එය අයදුම්පත් භාරදීමේදී තිබු එකම විය යුතුය.

2. විදේශ ගමන් බලපත්‍රය රැගෙන නොයෙන අයදුම්කරුවන්ට පරීක්ෂණයට සහභාගී වීමට අවසර නොලැබේ.

**8. ප්‍රථම පරීක්ෂණ වටයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීම.**

- **ප්‍රතිඵල නිවේදනය කිරිමේ දිනය**- 2018 මැයි 11 (ඉදිකිරීම්)
- **ප්‍රතිඵල නිවේදනය කිරිමේ දිනය-2018 ඔක්තෝම්බර් 19(නිෂ්පාදන)**

- **ප්‍රතිඵලනිවේදනයකිරිමේක්‍රමය-**

  01. ශ්‍රීලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවිය -www.slbfe.lk
  02. http://epstopik.hrdkorea.or.kr
  03. -http://www.eps.go.kr

- **එක් එක් අපේක්ෂයාගේ ප්‍රතිඵල නිවේදනය කිරිම.**

  -http://www.eps.go.kr

**II.** **දෙවන වටයේ පරීක්ෂණ( කුසලතා සහ නිපුණතා පරීක්ෂණය)**

**දෙවන වටයේ පරීක්ෂණය පැවැත්වීමේ ක්‍රමය**

| |
|---|
| ▪ අයදුම් කිරිමේ කාල පරිච්ඡේදය-2018 මැයි 14 සිට 2018 මැයි 16 දින දක්වා(දින 03)-ඉදිකිරීම් |

- අයදුම් කිරිමේ කාල පරිච්ඡේදය-2018 ඔක්තෝම්බර් 22 සිට 2018 ඔක්තෝම්බර් 22
- නිපුණතා පරීක්ෂණයට පෙනී සිටිමට කැමති අපේක්ෂකයින් සිය අයදුම්පත් භාරදීමේදී එම අයදුම්පත් භාරගැණීමට නියමිත ස්ථානවලදීම අදාළ ලේඛණ ඒ සඳහා භාරදිය යුතුවේ.
- නිපුණතා පරීක්ෂණය සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් එම ලියාපදිංචි ස්ථාන වෙත යා යුතු නැත.
- (පළමු වටයේ විභාගය සමත්වන්නන් සියළු දෙනාම නිරායාසයෙන්ම 02 වන වටය සඳහා තෝරා ගනු ලැබේ)
- **පරීක්ෂණ පවත්වන මධ්‍යස්ථාන සහ දිනය නිවේදනය කිරීම-2018 මැයි 30 (ඉදිකිරිම්)/2018 නොවැම්බර් 19 (නිෂ්පාදන)**
- **කුසලතා පරීක්ෂණය සහ නිපුණතා පරීක්ෂණයද එකම කාලයක පවත්වනු ලැබේ.-2018 ජුනි 06 සිට 10 දක්වා(ඉදිකිරිම්) 2018 නොවැම්බර් 24 දින සිට 27 වන දින දක්වා(වෙනස් විය හැක)**
- **ප්‍රතිඵල නිවේදනය කිරීම -2018 ජුනි 22 (ඉදිකිරිම්)/2018 දෙසැම්බර් 11 (නිෂ්පාදන)**

**01. නිපුණතා පරීක්ෂණය සඳහා ලේඛණ භාර දෙන අයදුම්කරුවන් සඳහා උපදෙස්-**

ප්‍රථම වටයේ විභාගය සමත් අය අතුරින් යමෙකුට තමා තෝරාගත් කර්මාන්ත ක්ෂේත්‍රයේ පළපුරුද්ද තිබේනම් ,ඊට අදාළ ක්ෂේත්‍රවල පුහුණුවක් ලබා සහතිකයක් තිබේ නම් හෝ ජාතික වෘත්තිය සහතික තිබේනම් මෙම නිපුණතා පරීක්ෂණයට පෙනී සිටිය හැකිය.

ප්‍රථම වටයේ පරීක්ෂණය සමත් අය නිරායාසයෙන්ම කුසලතා පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන අතර නිපුණතා පරීක්ෂණය අවශ්‍ය නම් ඒ සඳහා ලේඛණ මුල්ම ලියාපදිංචියේදී ලබාදිය යුතුවේ.

කුසලතා පරීක්ෂණයට සහභාගි නොවන අයට ඇගයුම් ලකුණු ක්‍රමවේදය තුළ ලකුණු ලබාගැනීම සඳහා සුදුසුකම් නොලබයි.

- **අයදුම් කිරිමේ කාලපරිච්ඡේදය**-2018 මැයි 14 දින සිට 16 දින දක්වා(ඉදිකිරිම්)/2018 ඔක්තෝම්බර් 22 සිට 24 දින දක්වා(නිෂ්පාදන)

  අයදුම්පත් භාරගන්නා ස්ථානය - කොරියානු භාෂා ප්‍රතිඵල නිවේදනය සමඟ දැනුම් දෙනු ලැබේ.
- **අයදුම්පත් භාරගන්නා ක්‍රමය** - පුද්ගලයාම පැමිණ භාරදිය යුතුය.
- **ගාස්තු** - නැත
- අවශ්‍ය වන ලේඛණ:

01. විදේශ ගමන් බලපත්‍රය සහ විභාග ප්‍රවේශ පත්‍රය සිය ඡායාරූපය අලවා ඇති කුඩා කොටස
02. නිපුණතා පරීක්ෂණය සඳහා වන අයදුම්කරුවන් විසින් පුරවන ලද පෝරමය
03. නිපුණතා පරීක්ෂණය සඳහා වෙනත් සාක්ෂි සඳහා ලේඛණ

| කොටස් | භාරදිය යුතු ලේඛණ | තොරතුරු | වෙනත් තොරතුරු |
|---|---|---|---|
| සේවා පළපරුද්ද 1 හෝ 2 තෝරන්න | වෘත්තීය සඳහා සහතික(01) | සේවා කරන ලද ආයතන වලින් ලබාගත් සේවා සහතික | අදාළ ආයතන විසින් ඉදිරිපත් කළ යුතුය(ඇමුණුම 2-2) |
| | පළපරුද්ද සඳහා ලේඛණ(02) | යම් අයදුම්කරුවෙකු සේවය කල ආයතන බංකොලොත් වී තිබෙන විට සහතික ලබාගත නොහැකි නිසා එසේ | ඇපකරුවන්ගේ හැඳුනුම්පත්වල පිටපත් සහ අත්සන් අවශ්‍ය වේ.<br><br>විදේශ රැකියාවල |

| | | | |
|---|---|---|---|
| | | වැඩකල බව සහතික කරන ලියවිලි ඇමුණුම් 2-3 භාවිතා කර ඥාතීන් නොවන ඇපකරුවන් දෙදෙනෙකු සහතික කර ඉදිරිපත් කළ හැක. | පලපුරුද්ද සඳහා වීසා පිටපත් සහ ආගමන විගමන සටහන් අවශ්‍ය වේ. |
| සම්පූර්ණ කළ පුහුණු පාඨමාලා | සම්පූර්ණ කළ පුහුණු පාඨමාලාවල මුල් සහතික අවශ්‍ය වේ. | පුහුණු පාඨමාලා සම්පූර්ණ කළ බවට ලබාදෙන රජයේ හෝ පෞද්ගලික අංශයේ සහතික ඉදිරිපත් කළ හැක | විශ්ව විද්‍යාල ඩිප්ලෝමා සහතික මේ සඳහා පිළිනොගනී. |
| ජාතික සහතික | ජාතික මට්ටමේ පුහුණු පාඨමාලා සහතික පිටපත් හෝ මුල් සහතික | ජාතික මට්ටමේ සහතික පමණක් මෙහිදී ඉදිරිපත් කළ යුතු අතර ඒවා ජාතික මට්ටමේ තොරතුරු වල තිබිය යුතුය. | විදෙස් සහතික අදාළ නොවේ.<br>විශ්ව විද්‍යාල සහතික අදාළ නොවේ. |

- කොරියාවේ රැකියා කළ තොරතුරු මේ සඳහා අදාළ වේ.
- කොරියාවේ මානව සම්පත් සංවර්ධන අංශය මඟින්ඉදිරිපත් කළ පෝරමයට අමතරව රැකියාව සඳහා EPS ක්‍රමය මඟින් ලබාදුන් සහතික මේ සඳහා අදාළ වේ.
- පුහුණු සහතික වල පාඨමාලාවේ නම,පැය ගණන සහ අන්තර්ගතය සඳහන් විය යුතුය.
- මෙම නිපුණතා පරීක්ෂණයට භාරදෙන ලේඛණවල හෝ සහතිකවල යම් සාවද්‍ය ක් ව්‍යාජ බවක් අනාවරණය වුවහොත් එම අපේක්ෂකයාගේ විභාග ප්‍රතිඵල සම්පූර්ණයෙන් අවලංගු කරන අතර නැවත EPS පරීක්ෂණය සඳහා ඉදිරිපත් වීමටද වසර 03 කට තහනම් කරනු ලැබේ.

**අවසර නැති රැකියා පලපුරුද්ද,පුහුණු පාඨමාලා සහ ජාතික සහතික සඳහා උදාහරණ-**

**රැකියා පළපුරුද්ද-**

අයදුම්කල කර්මාන්ත ක්ෂේත්‍රය තුළද අතීතයේ වැඩකර ඇති බවට අයදුම්කරුට සාක්ෂි තිබුණද එම පලපුරුද්ද අදාළ නොවන විට ඒ සඳහා අවසර නොලැබේ.අලෙවිය පිළිබඳව මානව සම්පත් පිළිබඳ,ගිණුම් ක්ෂේත්‍රය ,අධ්‍යාපනය,මහජනතාවය(තාක්ෂණ වේදීන් නොවන),ගැස්පල්,සූප ශාස්ත්‍ර,සේවා,කොණ්ඩා කැපීම් යනාදිය පිළිගන්නේ නැත.

නිෂ්පාදන,කර්මාන්ත,ඉදිකිරීම්,ධීවර,කෘෂි ,කොහු නඩත්තු ව්‍යාපාරික කර්මාන්ත ක්ෂේත්‍රයේ උපදේශකයින් ලෙස පෙර වැඩකළ අත්දැකීම් පිළිබඳ ලේඛණ නිෂ්පාදන ක්ෂේත්‍රයේ ඇසුරුම් අංශයේ රැකියා සඳහා ඉල්ලුම් කළ අයදුම්කරුවන්ට ඉදිරිපත් කළහැකිය.

**පුහුණු පාඨමාලා -**ඉල්ලුම් කළ ක්ෂේත්‍රෙයට නොගැළපෙන පුහුණුවීම් සඳහා වන සහතික පිළිනොගනී. උදාහරණ ලෙස හෙද සේවා පුහුණු, ගිණුම්, නායකත්ව පුහුණුව ආදිය මේ සඳහා පිළිගන්නේ නැත.

**ජාතික සහතික-** අයදුම්කරු ඉල්ලුම්කරන ක්ෂේත්‍රයට අදාළ නොවන ජාතික සහතික ඉදිරිපත් කිරීමෙන් වැලකී සිටිය යුතුය.

උදා - රියදුරු බලපත්‍ර, භාෂා පුහුණු සහතික, වෘත්තීමය බලපත්‍ර (වෛද්‍ය, .......නීති) සහතික පිළිනොගනී.

02. **පරීක්ෂණය පවත්වන දිනය හා ස්ථානය නිවේදනය**

- **දිනය** - 2018 මැයි 30 (ඉදිකිරිම්)/2018 නොවැම්බර් 19(නිෂ්පාදනය)
- **නිවේදනය කරන දිනය** - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවිය

**03. කුසලතා පරීක්ෂණය පැවැත්වීම**

- ○ **කුසලතා ක්ෂේත්‍රයේ උප කොටස් සහ ලකුණු ව්‍යාප්තිය**

| **කර්මාන්තය (කුසලතා පරීක්ෂණය)** | **මුළු ලකුණු** | **කුසලතා පරීක්ෂණ** | | |
|---|---|---|---|---|
| | | **කායික ශක්තිය** | **සම්මුඛ පරීක්ෂණය** | **පොදු කුසලතා** |
| නිෂ්පාදන | 100 | 30 | 30 | 40 |
| ඉදිකිරිම් | 110 | 30 | 30 | 50 |

- ○ **පරීක්ෂණ කාලය** - 2018 ජුනි 06 සිට ජුනි 10 දක්වා(ඉදිකිරිම්)
  - ▪ **2018 නොවැම්බර් 24 සිය 27 දක්වා(නිෂ්පාදන)**
- \- අයදුම්කරුවන්ගේ ප්‍රමාණය අනුව ඉහත කාලපරිච්ඡේද වෙනස්විය හැකිය.

**පරීක්ෂණ උපලේඛණය 2018 මැයි 30 ඉදිකිරිම් ,2018 නොවැම්බර් 19 නිෂ්පාදන දින ප්‍රසිද්ධියට පත්කරනු ලැබේ.**

- ○ **පරීක්ෂණ කාලරාමුව**

| **සැසිය** | **දැනුවත් කිරීම (මිනිත්තු 30)** | **කාලපරිච්ඡේදය** | **ලකුණු** |
|---|---|---|---|
| පළමු සැසිය | 08.30 – 09.00 | 09.00 – 12.00 | 12.00 – 12.30 |
| දෙවන සැසිය | 13.00 – 13.30 | 13.30 – 16.30 | 16.30 – 17.00 |

අපේක්ෂකයින් හට තමන්ට ලැබුණු කාලරාමුව වෙනස්කළ නොහැක. දෙන ලද කාලයෙන් පසුව පැමිණෙන අය පරීක්ෂණය සඳහා සුදුසුකම් නොලබයි.( පෙ.ව.8.30/ප.ව.1.00)

- ❖ නිපුණතා පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ ලේඛණ සහ සහතික මෙම කුසලතා පරීක්ෂණයේ දී පවත්වන සම්මුඛ පරීක්ෂණයේ දී නැවත සනාථ කරගනු ලැබේ. එම අවස්ථාවේ දී යම් ලේඛණයක් හෝ සහතිකයක් ව්‍යාජ බවට අනාවරණය වුවත්, අයදුම්කරුගේ ප්‍රතිඵල තහනම් වන අතර, නැවත EPS ක්‍රමයට ඇතුල්වීම වසර 03 කට තහනම් කරයි. (අයදුම්කරු බලධාරින් වෙත ඉදිරිපත් කරනුලැබේ)

**III. ප්‍රතිඵල නිවේදනය කිරිම**

- ○ **පරීක්ෂණ ප්‍රතිඵල නිවේදනය** - 2018 ජුනි 22 (ඉදිකිරිම්)/2018 දෙසැම්බර් 11 (නිෂ්පාදන)
- ○ නිවේදනය කරනු ලබන ක්‍රමවේදය -
  01. ශ්‍රිලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවිය -www.slbfe.lk
  02. http://www.eps.go.kr
  03. http://epstopik.hrdkorea.or.kr
- ○ **එක් එක් අපේක්ෂයාගේ ප්‍රතිඵල නිවේදනය කිරිම.**

-http://www.eps.go.kr

ඇගයුම් මත ලකුණු දීමේ ක්‍රමය මඟින් පවත්වන පරීක්ෂණයේ ප්‍රතිඵලවල වලංගු භාවය- නිවේදනය කළ දින සිට වසර දෙකක් දක්වා වලංගු වේ.**(2018 ජුනි 22 සිට 2020 ජුනි 21 දක්වා-ඉදිකිරීම්)/2018 දෙසැම්බර් මස 11 සිට 2020 දෙසැම්බර් මස 10 දක්වා-නිෂ්පාදන)**

**IV.දැනගත යුතු වෙනත් කරුණු -**

01. පරීක්ෂණ අවස්ථාවල කිසිදු සන්නිවේදන උපකරණයක්,විද්‍යුත් උපකරණ ලබාගැනීම සම්පූර්ණ තහනම් වේ.දුරකථන,ලැප්ටොප්,ටැබ්ලට්,විද්‍යුත් සටහන් පොත් ආදී කිසිවක් ළඟ තබාගත නොහැක.
    මේවා ළඟ තබාගැනීම මඟින් විභාග වංචා සිදුකිරීමට උත්සහා කළ බවට චෝදනා එල්ල වේ.

02. විභාග මධ්‍යස්ථාන තුළ සුවිනිතව හැසිරීම,මඟින් විභාග ඒක්‍රග්‍රතාවය බිඳීමට කටයුතු කළ බවට චෝදනා කර වසර දෙකක විභාග තහනමක් පනවනු ලැබේ.

03. නිපුණතා පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලේඛණ අවස්ථා තුනකදී පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.එම ලේඛණ අසත්‍ය බව අනාවරණය වුවහොත් වසර තුනක විභාග තහනමක් අයදුම්කරුට ලැබේ.

04. අයදුම්පත්‍රයේ හා ගමන් බලපත්‍රයේ තොරතුර පරස්පර වීමෙන් අයදුම්කරුට මෙම ඇගයුම් ලකුණු ක්‍රමයට ඉදිරිපත්වීම අවස්ථාව නොලැබී යයි.

05. වෘත්තීය සඳහා වන සහතික සහ රැකියාව සහතික කිරිම සඳහා ඉදිරිපත් කරන ලේඛණවල ඇතුළත් කිසිදු තොරතුරක් විකෘති කිරීමට, මැකීමට, අත්සන් ව්‍යාජ ලෙස යෙදීම සිදු නොකළ යුතුය. එවැනි වෙනස්කම් සිදුකර තිබෙන අයදුම්කරුවන්ගේ වලංගු භාවය අහෝසි කරනු ලැබේ.

විභාගය සමත් වූ තැනැත්තෙකු වෙබ් අඩවියට ඇතුළු වීමට( Valid Roster ) අවස්ථාව සලසා ගන්නා නමුදු එමඟින් රැකියා අවස්ථාවක් නිශ්චිත වශයෙන් රැකියා අවස්ථාවක් ලබාගැනීමට හිමිකමක් නොලබයි.

එසේම කිසියම් තැනැත්තෙකු වෛද්‍ය පරීක්ෂණය අසමත් වුවහොත් හෝ නීත්‍යානුකූල නොවන පරිදි කොරියානු රාජයෙහි රැඳී සිටි බවට වාර්තා ඇත්නම් මෙම රැකියා ලැබීමේ අවස්ථා අහිමි වේ.

එසේම කොරියාවට ඇතුළුවීමෙන් පසුව පවත්වනු ලබන මත්ද්‍රව්‍ය පිළිබඳ පරීක්ෂණයෙන් කිසියම් තැනැත්තෙකු අසමත් වුවහොත් එම තැනැත්තා ආපසු තම රටට හරහා යවනු ලැබේ.

කිසියම් තැනැත්තේ වීසා කාණ්ඩය යටතේ හෝ වීසා කාණ්ඩය යටතේ මුළු වශයෙන් වසර 05ක් ඉක්මවා දකුණු කොරියානු රටෙහි සේවය කර ඇත්නම් එවැනි තැනැත්තෙු මෙම පසෘීක්ෂණය සඳහා පෙණී සිටිමිට සුදුසුකම් නොලබයි.

2017 වර්ෂයේ සිට මෙම පරීක්ෂණයේ විභාග කාලය ප්‍රශ්න වෙනස් කර ඇත.

= විනාඩි 50(කියවීම (ප්‍රශ්න 20))25 විනාඩි,සවන්දීම ((ප්‍රශ්න 20)) විනාඩි 25)

පරීක්ෂණයේ අවම ලකුණු ප්‍රමාණය නිෂ්පාදන අංශය සඳහා පමණක් ලකුණු 44 ක් වශයෙන් වෙනස් කර ඇත.

නිපුණතා පරීක්ෂණය සඳහා පෙනි සිටින අය ඒ සඳහා අදාළ ලේඛණ ඉදිරිපත් කළ යුතුය.

**කුසලතා පරීක්ෂණයේ ආකෘතිය**

| කර්මාන්තය | කාණ්ඩය | කාර්යය | අන්තර්ගතය |
|---|---|---|---|
| නිෂ්පාදන<br>. | සැකසීම | පින් ඇතුල් කිරිම | රූප සටහන අනුව වර්ණය සහ ප්‍රමාණය සහ හැඩය අනුව අදාළ සැකැස්ම ඇතුල් කරන්න |
| | | අයිතම එල්ලීම | වළලු ප්‍රමාණය අනුව අදාළ දණ්ඩේ එල්ලීම |
| | | බොල්ට් සහ නට් එකට සවි කිරිම | දෙන ලද කාලය තුළදී අදාළ සටහන අනුව දෙයාකාරයකින් යුත් නට් සහ බෝල්ට් තද කිරිම |
| | මිනුම් | පින් ඇතුල් කිරිම | රූප සටහන අනුව වර්ණය සහ ප්‍රමාණය සහ හැඩය අනුව අදාළ සැකැස්මට ඇතුල් කරන්න |
| | | අයිතම එල්ලීම | වළලු ප්‍රමාණය අනුව අදාළ දණ්ඩේ එල්ලීම |
| | | මිනුම් | දෙන ලද කාලය තුළ දිග සහ පරිමාව අනුව මැනීම |
| | එක් කිරිම | පින් ඇතුල් කිරිම | රූප සටහන අනුව වර්ණය සහ ප්‍රමාණය සහ හැඩය අනුව අදාළ සැකැස්මට ඇතුල් කරන්න |
| | | අයිතම එල්ලීම | වළලු ප්‍රමාණය අනුව අදාළ දණ්ඩේ එල්ලීම |
| | | | දෙන ලද කාලය තුළ නියමිත ස්ථානයක සවි කර ඇති වස්තූන් දෙකක් සපයනු ලබන උපකරණ මඟින් එකට සම්බන්ධ කිරිම. |
| ඉදිකිරිම් | යකඩ වැඩ | පින් ඇතුල් කිරිම | රූප සටහන අනුව වර්ණය සහ ප්‍රමාණය සහ හැඩය අනුව අදාළ සැකැස්මට ඇතුල් කරන්න |
| | | යකඩ එකතු කිරිම සවි කිරිම | රූප සටහන අනුව යකඩය සවි කිරිම |
| | ලී වැඩ | පින් ඇතුල් කිරිම | රූප සටහන අනුව වර්ණය සහ ප්‍රමාණය සහ හැඩය අනුව අදාළ සැකැස්ම ඇතුල් කරන්න |
| | | පැනලය සකස් කිරිම | දෙන ලද කාලය තුළ අදාළ රූප සටහන අනුව පැනලය සකස් කිරිම |

(රැකියා පළපුරුද්ද, සම්පූර්ණ කරන ලද පුහුණු පාඨමාලා,ජාතික මට්ටමේ සහතික)

නිපුණතා පරීක්ෂණයට අදාළ ලිපි ලේඛණ

| අයදුම්පත් අංකය(විදේශගත කරන ඒජන්සියේ ප්‍රයෝජනය සඳහා) | |
|---|---|

EPS-TOPIK විභාගයට ලියාපදිංචි සහතිකවල ( වෘත්තීය සහතික/සහතිකපත්වල පිටපත්) අසත්‍ය පිටපත් තිබේනම් මා විසින් එහි වගකීම භාරගනිමි.

※.අයදුම්කරු විසින් ලබාදෙන සහතිකපත් ව්‍යාජ ලේඛණ බවට තහවුරු වුවහොත් විභාග ප්‍රතිඵල අවලංගු වන අතර වසර දෙකක් සඳහා නැවත විභාගයකට පෙනී සිටීමට ද නොහැකි වේ.

**අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුය**

* ඔබ විසින් තෝරාගත් අංශය සඳහන් කිරීම සඳහා (●)

| **EPS-TOPIK ලියාපදිංචි අංකය** | | | | |
|---|---|---|---|---|
| නිෂ්පාදන | ·සැකසීම(○) ·මිණුම් ඩුඩු(○) ·එකතු කිරීම(○) | ඉදිකිරීම් | | කම්බි බැඳීම(○) ·වඩු වැඩ(○) |
| කෘෂිකර්ම සහ සත්ව පාලනය | ·කෘෂිකර්ම(○)· පශු සම්පත්(○) | ධීවර | | ·මුහුදු වගාව(○)·වෙරළ සහ වෙරළාශ්‍රිත නොගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය(○) |
| උපන් දිනය | . . . | දුරකථන අංකය | | |
| ලියාපදිංචි දිනය | 20 . . | නම | ( අත්සන) | |

**අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුය**

ඔබගේ පිළිතුර සටහන් කරන්න (●)

විදේශගත කරන ඒජන්සියේ ප්‍රයෝජනයදහා

☐ **රැකියා පළපුරුද්ද (රැකියා පළපුරුද්ද ඇති අය සඳහා පමණි)**

| වසරක් හෝ ඊට වැඩි | වසරකට අඩු |
|---|---|
| ○ | ○ |

| | |
|---|---|
| සත්‍ය | ○ |
| අසත්‍ය | ○ |

☐ **පුහුණු කාලය -පැය ගණන ( පුහුණුව ලබා ඇති අය සඳහා පමණි)**

| පැය 120 හෝ ඊට වැඩි | පැය 120 ට අඩු |
|---|---|
| ○ | ○ |

| | |
|---|---|
| සත්‍ය | ○ |
| අසත්‍ය | ○ |

☐ **සහතික ( සහතිකපත් ඇති අය සඳහා, සහතිකපත් දෙකකට වඩා නොවැඩි )**

| අංකය. | සහතිකයේ නම | නිකුත් කළ දිනය | ආයතනය/සංවිධානය |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |

| | |
|---|---|
| සත්‍ය | ○ |
| අසත්‍ය | ○ |

විදේශගත කරන ඒජන්සිය නම : ( අත්සන)

සම්මුඛ පරීක්ෂණය සිදු කරනු ලබන පුද්ගලයා නම: ( අත්සන)

රැකියාව කළ සම්පූර්ණ කාලය මාස අනුව සටහන් කළ යුතුය./පළමුව පුහුණු පාඨමාලා සහතික නිවැරදි බවට තහවුරු කරගෙන දෙවනුව සම්පූර්ණ සේවා කාලය සඳහන්කළ යුතුය.

ලිපි ලේඛණ සත්‍ය බවට තහවුරු කර සම්පූර්ණ සහතික ගණන සඳහන් කළ යුතුය.

≪ පෙර සේවා ස්ථානයෙන් (කම්පැණියෙන්) වෘත්තීය සහතික නිකුත් කරන විට≫

කර්මාන්ත ආයතනය කොරියානු ආයතනයක් නොවන්නේ නම්, බඳවාගත් ඒජන්සියේ තොරතුරු සඳහන් කරන්න.

**වෘත්තිය සහතික**

**ලියාපදිංචි අංකය:**

| | | | | |
|---|---|---|---|---|
| පෞද්ගලික තොරතුරු | ජාතිකත්වය | ශ්‍රී ලාංකික | ජාතික හැඳුනුම්පත් අංකය | ********* |
| | සම්පූර්ණ නම | ---------------------------- | දුරකථන අංක | |
| | | | ස්ථාවර දුරකථන | -------------------- |
| | වර්තමාන ලිපිනය | --------------------------------- | ජංගම දුරකථන | ----------------------- |
| | | | විද්‍යුත් තැපැල් ලිපිනය | |

| | | | |
|---|---|---|---|
| වෘත්තීයට අදාළ තොරතුරු | සේවය කළ කාල සීමාව (වසර.මාසය. දිනය~වසර.මාසය. දිනය) | තනතුර | කාර්යය( අදාළ විශේෂිත තොරතුරු සඳහන් කරන්න) |
| | ~ | | |
| | ~ | | |
| | ~ | | |
| | ~ | | |
| | ~ | | |
| | **එකතුව** | **සේවය කළ මුළු කාලය:** | |

දඩුවම් ලැබිය හැකි වරදක් වන වැරදි සහගත ලිපි ලේඛණ සම්බන්ධව ඇති සියලු ,ප්‍රතිපත්ති මා විසින් පිළිගන්නා බව දන්වා සිටිමි.මෙම ලිපි ලේඛණ කොරියානු රජය හා ශ්‍රී ලංකාව සමඟ ඇති ද්වී පාර්ශවික ගිවිසුම මඟින් එකඟ වී ඇති පරිදි විභාගය ඇගයීම සඳහා අවශ්‍ය බව මා දනිමි.

දිනය:

නම: ( අත්සන)

ඉහත සඳහන් තොරතුරු නිවැරදි හා සත්‍ය බව සහතික කරමි..

දිනය:

ආයතනය :　　　　　　　දුරකථන අංකය.:

ලිපිනය:

ආයතන ප්‍රධානියා : ( අත්සන හෝ නිල මුද්‍රාව)

| නිකුත් කළේ | |
|---|---|
| දෙපාර්තමේන්තුව | |
| තනතුර | |
| දුරකථන අංක | |
| නම | අත්සන |

**කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනයේ සභාපති**

※අවවාදයයි:- අත්සන, නිල මුද්‍රාව,නම,සම්බන්ධ කරගත හැකි දුරකථන අංක යනාදි වැදගත් තොරතුරු සඳහන් නොකිරීමසේවා පළපුරුද්ද අවලංගු කිරීමට හේතු වේ.

මෙය අදාළ ආයතනයෙන් සේවා පලපුරුද්ද සනාථ කිරීමකි.

වෘත්තීය සහතිකපත් ලබාගත නොහැකි,ඉතා කුඩා ඉතිහාසයක් ඇති,කුඩා ප්‍රමාණයේ ව්‍යාපාර,බංකොලොත් වූ කර්මාන්ත හෝ ඒජන්සි ආයතන(විදේශීය ආයතන වෙනුවෙන්) සහ අවිධිමත් කෘෂිකර්ම ක්ෂේත්‍ර,සතුන් බෝ කිරීමේ ක්ෂේත්‍ර සඳහා පහත සඳහන් පෝරමය සම්පූර්ණ කර භාරදිය හැකිය.( ඥාතීන් නොවන ඇපකරුවන් දෙදෙනෙකු විසින් සාමූහිකව ඇප වීම අවශ්‍ය වේ)

සේවා පළපුරුද්ද තහවුරු කරගැනීම සඳහා අයදුම්කරුවන් විසින් එක් එක් ආයතනය සඳහා වෙන් වෙන්ව පෝරම ඉදිරිපත් කළ යුතුයි.( උදා- ආයතන 04 ක් නම් පෝරම 04 ක්)

EPS (රැකියා අවසර පත්‍ර ක්‍රමය) සහතිකය මෙය වෙනුවට භාවිතා කළ හැක.

## එක් අයෙකුගේ රැකියාවක් සනාථ කිරිමේ ලේඛණය(සම්මත ආකෘතිය)

**ලියාපදිංචි අංකය:**

| | | | |
|---|---|---|---|
| නම | | උපන් දිනය | |
| ජාතික හැඳුනුම්පත් අංකය | | දුරකථන අංකය | |

| ආයතනය | තනතුර | සේවය කළ කාලය | කාර්යය | සටහන් |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| ※ අදාළ සේවා පලපුරුද්ද සම්පූර්ණ කිරීම අවශ්‍ය වේ. | | | | |
| | | | | |
| එකතුව | | සේවය කළ මුළු කාල පරිච්ඡේදය: | | |

ලේඛණ සහතික කරන පුද්ගලයා-1

නම : ( අත්සන) උපන් දිනය :

ලිපිනය :

රැකියා ස්ථානය : තනතුර : ස්ථාවර දුරකථන : (ජංගම දුරකථන)

අයදුම්කරුට ඇති සබඳතාව :

| |
|---|
| ලේඛණ සහතික කරන පුද්ගලයා-2 |
| නම : ( අත්සන) උපන් දිනය : |
| ලිපිනය : |
| රැකියා ස්ථානය : තනතුර : ස්ථාවර දුරකථන : (ජංගම දුරකථන) |
| අයඳුම්කරුට ඇති සබඳතාව : |

- ඉහතින් ඔබගේ සේවය සහතික කරනු ලබන පුද්ගලයන්ගේ ජාතික හැඳුනුම්පත් පිටපත් ඇමිණිය යුතුය.
- අවවාදයයි-1. ඔබගේ රැකියාවසහතික කරන පුද්ගලයාගේ නම,දුරකථන අංකය,යනාදිය සපයා නොමැති නම් මෙම ලේඛණය පිළිගනු නොලැබේ. එසේම රැකියා පළපුරුද්ද සඳහා කිසිදු වටිනාමක් නොලැබේ.
- අවවාදයයි-2. පෙර කරන ලද විදේශ රැකියා පලපුරුද්ද තහවුරු කිරිම සඳහා රැකියාව සඳහා නිකුත් කළ වීසා පිටපත සහ ආගමන විගමන සටහන් අවශ්‍ය වේ. එසේ අවශ්‍ය ලිපිලේඛණ නොමැති නම් මෙම සහතිකය ඉදිරිපත් කළ නොහැක.